යෝජනා කෙටුම්පත : ¦ ලංකාවේ ප්‍රතිසන්ධානය හා වගවීම ප්‍රවර්ධනය කිරීම (3/6/12)

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය,මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, මානව හිමිකම් පිළිබඳ ජාත්‍යාන්තර ගිවිසුම් හා අනිකුත් අදාල ලේඛන වල මඟපෙන්වීම අනුව යමින්ද,

රටක් ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමේදී ගන්නා ඕනෑම පියවරකදී ජාත්‍යාන්තර නීතිය යටතේ ඔවුන්ගේ බැඳීම් හා විශේෂයෙන්ම ජාත්‍යාන්තර මානව හිමිකම්, සරණාගතයන් හා මානුෂවාදී නීති ආදිය උචිත ලෙස අනුගමනය කිරීමට සහතික විය යුතු බව යළි තහවුරු කරමින්ද,

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ (LLRC) වාර්තාවේ ඉදිරිපත් කර ඇති කරුණු හා නිර්දේශ දායක කරගත හැකි බව සටහන් කරමින්ද,

නීති විරෝධී ඝාතන හා බලාත්මකකාරී අතුරුදහන්කිරීම් පිළිබඳ පැතිරීගිය චෝදනා ගැන විශ්වසනීය විමර්ශනයක අවශ්‍යතාව, ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශ හමුදා පාලනයෙන් නිදහස් කිරීම, ඉඩම් ආරවුල් විසඳීම සඳහා අපක්ෂපාති යාන්ත්‍රණයක් පිහිටුවීම, රැඳවුම් ප්‍රතිපත්ති නැවත ඇගයීමට ලක් කිරීම, කලින් ස්වාධීනව පැවති සිවිල් ආයතන ශක්තිමත් කිරීම, පළාත්වලට බලය විමධ්‍යගතකිරීම පිළිබඳව දේශපාලන විසඳුමකට එළඹීම, සියලුදෙනාගේම අදහස් ප්‍රකාශකිරීමේ අයිතිය ආරක්ෂාකිරීම හා ප්‍රවර්ධනය, සහ නීතියේ ආධිපත්‍යය පිළිබඳ ප්‍රතිසංස්කරණ පැනවීම ඇතුළු උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ (LLRC) වාර්තාවේ අඩංගු සුභවාදී නිර්දේශයන් උණුසුම් ලෙස පිළිගනිමින්ද,

අන්තර්ජාතික නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීම් පිළිබඳව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබීම ගැන කනස්සල්ල සටහන් කරමින්ද,

1. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ (LLRC) වාර්තාවේ අඩංගු සුභවාදී නිර්දේශයන් ක්‍රියාත්මක කරන ලෙස හා සියලු ශ්‍රී ලාංකිකයන්ට යුක්තිය, සාධාරණත්වය, වගවීම හා ප්‍රතිසන්ධානය සහතික කෙරෙන විශ්වසනීය හා ස්වාධීන ක්‍රියාමාර්ගයක් ආරම්භකිරීම තුළින් අදාල නෛතික බැඳීම් හා කැපවීම් ඉෂ්ට කිරීමට අවශ්‍ය සියලු අවශ්‍ය අතිරේත පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටී.

2. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ (LLRC) වාර්තාවේ අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට මෙන්ම ජාත්‍යාන්තර නීති උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා ගැන කටයුතු කිරීමට රජය ගෙන ඇති හා ගත්නා පියවර විස්තරාත්මකව දක්වන පරිපූර්ණ ක්‍රියාකාරී සැළැස්මක් හැකි ඉක්මණින් ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටී.

3. ඉහත සඳහන් පියවර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් හා තාක්ෂණික සහය ලබාදීමට මානව හිමිකම් මහ කොමසාර්ස් කාර්යාලය හා අදාල විශේෂ ක්‍රියාමාර්ග සැපයීමත්, ශ්‍රී ලංකා රජය ඒවා පිළි ගැනීමත් දිරිමත් කරන අතර, ඉහත සඳහන් සහය ලබාදීම පිළිබඳ වාර්තාවක් කවුන්සිලයේ 22 වැනි සැසිවාරයට ඉදිරිපත් කරන ලෙස මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලා සිටී.